# විශ්වවිද්‍යාල රෝහල
# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

පුහුණු තනතුරු සඳහා වන පුරප්පාඩු
අක්ෂි තාක්ෂණවේදී/විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු/විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු

1. **අක්ෂි තාක්ෂණවේදී (පුහුණු) :**

සුදුසුකම් :

I. සිංහල භාෂාව /දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව විෂයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

**සහ**

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යෙන් විද්‍යා විෂය ධාරාවෙන් ''භෞතික විද්‍යාව" විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් 02 ක් එකවර සමත් වීම.

*වයස් සීමාව :*

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 25 ට නොවැඩි අයවිය යුතුය.

*වැටුප් පරිමාණය :*

2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016./ උපලේඛනය V අනුව ගෙවීම් සිදු කෙරේ. (මසකට රු. 25,790.00)

2. **විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු (පුහුණු)**

සුදුසුකම්:

I. සිංහල භාෂාව /දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

**සහ**

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ''ජීව විද්‍යාව" විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් එකවරක දී සමත්වීම.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 25 ට නොවැඩි අයවිය යුතුය.

*වැටුප් පරිමාණය :*

2016.02.25 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016, උපලේඛනය V අනුව ගෙවීම් සිදු කෙරේ. (මසකට රු. 25,790.00)

3. **විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු (පුහුණු)**

*සුදුසුකම් :*

I. සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

**සහ**

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යෙන් ''ජීවවිද්‍යාව" විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් එකවරකදී සමත් වීම.

*වයස් සීමාව :*

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 25 ට නොවැඩි අයවිය යුතුය.

*වැටුප් පරිමාණය :*

2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016, උපලේඛනය V අනුව ගෙවීම් සිදු කෙරේ. (මසකට රු. 25,790.00)

**පොදු කොන්දේසි :**

1. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2022.04.18** දිනට පෙර ''විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර"යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
2. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල රෝහල සතුවේ.
3. ප්‍රමාදවූ, අසම්පූර්ණ හෝ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4. අයදුම්පත්‍රය සහ අදාළ අනෙකුත් විස්තර භාගත කිරීම සඳහා www.kdu.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.